වාර්ෂික වාර්තාව

2018

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය

පටුන

මාතෘකාව	**පිටු අංකය**
දැක්ම සහ මෙහෙවර	3
අධ්‍යක්ෂ මණ්ඩලය	4
සභාපතිතුමාගේසමාලෝචනය	7
මණ්ඩලයේ තොරතුරු	8
සමස්ත කාර්ය සාධනය -2018	9
වාර්ෂික ගිණුම් වාර්තාව	14
විගණකාධිපති වාර්තාව	41

2018
වාර්ෂිකවාර්තාව

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය

<u>අපේදැක්ම</u>

ගොවි ජනතාවගේ සහ අඩු වරප්‍රසාද ඇති ජනතාවගේ අභිමානය නැවතත් ඇති කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් ආර්ථික ස්වාධීනත්වය සහ ස්ව විශ්වාසය ඇති කිරීම.

<u>අපේමෙහෙවර</u>

ප්‍රතිලාභීනේග් ආර්ථික ස්වාධීනත්වය ඇති කිරීමටත් අනුන් මත යැපීමේ සංස්කෘතිය මග හැරවීම සඳහාත් කෘෂිකර්ම, පශු සම්පත් සහ වෙනත් ක්ෂේත්‍ර වල නිපුණතා සංවර්ධනය සඳහා සහභාගීත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

2018 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලය

(2018.01.29 සිට 2018.03.21 දක්වා)

නම	තනතුර	සේවාස්ථානය
ධම්මික පිරිස් මහතා	සභාපති	ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය (ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය)
කේ.ඒ.බණ්ඩාරමහතා	උපසභාපති	ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය (ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය)
කේ. මහේසන් මහතා	අතිරේක ලේකම් (සංවර්ධන)	ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතුඅමාත්‍යාංශය
පී.එස්.එස්.විජේරත්න මහතා	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්	කෘෂිකර්ම අමාත්‍යාංශය
ඩබ්. ඒ. ඩී. සී. එම්. ප්‍රියන්ත මහතා	ප්‍රධාන අභ්‍යන්තර විගණක	වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
විජයසිරි වික්‍රමසිංහ මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	අංක 409/3සී, මහයියාවත්ත, කලපුවාව, මුල්ලේරියාව නගරය
එච්.ක්‍රිෂාන්නිලංගමහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	අංක:ඒ/4 දියතෙර. පහලවෙලපාර, පැලවත්ත.
පී.ඩබ්.ධර්මසිරි වැලිකල මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	අංක 95, බණ්ඩාරනායක මාවත, මිහිඳුපුර, අනුරාධපුර
ඒ.ටී.එම්. ඒකනායක මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	අංක 121, යසසිරිපුර, අනුරාධපුර

2018 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලය

(2018.08.08 සිට 2018.12.17 දක්වා)

නම	තනතුර	සේවාස්ථානය
නීතිඥ බුද්ධික ඉද්දමල්ගොඩමහතා	සභාපති	ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය (ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය)
සී.එච් කුමාරසිංහමහතා	උපසභාපති	ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය (ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය)
කේ. මහේසන් මහතා	අතිරේක ලේකම් (සංවර්ධන)	ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතුඅමාත්‍යාංශය
චම්පිකා ධර්මසේනමහත්මිය	අධ්‍යක්ෂ (සංවර්ධන)	කෘෂිකර්ම අමාත්‍යාංශය
ඩබ්.ඒ. සී.ඩී.එම්.ප්‍රියන්ත මහතා	ප්‍රධාන අභ්‍යන්තර විගණක	වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
චමින්ද පතිරණමහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	ලේක් එජ් හොලිඩේ ඉන්, සදුන්ගමපාර, තිස්සමහාරාමය.
අරෝෂ රොද්‍රිගෝමහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	අංක65, එපාර්ට්මන්ට්6/2, කැපිටල්රෙසිඩන්ස්, ධර්මපාලමාවත, කොළඹ07.
ආර්.එම්.ඒ. චන්ද්‍රදාසමහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	අංක11/4සී, ප්‍රෙස්ට්ට්ප්කෝට්ස්, සුමනසාරමාවත, වෙලේගොඩ, මාතර.

2018වර්ෂයේ අධ්‍යක්ෂමණ්ඩල රැස්වීම් පැවැත්වූ දිනයන්

- 385වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2018.01.29
- 386වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2018.02.16
- 387වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2018.03.21
- 388වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2018.08.08
- 389වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2018.09.07
- 390වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2018.10.12
- 391වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2018.11.28
- 392වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2018.12.17

2018 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල පැවැත්වූ වාර ගණන08කි.

සභාපතිතුමාගේ සමාලෝචනය.

තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා බහු ආංශික ප්‍රවේශයක් තුළින් ආහාර සුරක්ෂිතතාවසහ ජාතික සමෘධිය සහතික කරමින් ශ්‍රීලංකාවේ නව කෘෂි ආහාර කර්මාන්තයට සහභාගි වීමට ලැබීම මහත් සතුටකි. තව දුරටත්, ශ්‍රී ලංකාව අවධානය යොමු කර ඇත්තේ නිල හරිත ආර්ථික ප්‍රතිපත්තියක් වෙත වන අතර එහිදීආර්ථිකයහා සමාජ තත්වයන් වෙනස් වීමත් සමඟ සැමටපරිසර හිතකාමී වාතාවරණයක් ඇති කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

ශ්‍රීලංකාවේ පරිභෝජන රටාව වෙනස් කිරීම දිනෙන් දින ඉහළ යමින් පවතින අතර, පසුගිය දශක කිහිපය තුළදියවැඩියා වසංගතයවිවිධපිළිකාසහරුධිර කොලෙස්ටරෝල් මට්ටම ඉහළ යෑම ඇතුළු බෝ නොවන රෝග සීඝ්‍රයෙන්ඉහළ යමින් සෑම වසරකම බොහෝ ජීවිත බිලි ගනියි. සාමාන්‍යයෙන් සියලුම මරණ වලින් 75% ක්ම සිදු වන්නේ බෝ නොවන රෝග නිසාය. මේ සියල්ල ආහාර පුරුදු හා සම්බන්ධ ගැටලුවේ. එබැවින් සම්ප්‍රදායේ සිට සෞඛ්‍යයට අහිතකර බටහිර රටාවකට ආහාර මාරුවීම රට තුළ දැඩි මහජන ගැටලුවක් ලෙස දැකිය හැකියි.

බටහිර බලය ආක්‍රමණය කිරීමෙන් පසු ආහාර පුරුදු,සෞඛ්‍ය සහ දීර්ඝායුෂ පිළිබඳ ඇදහිය නොහැකි තරම් අත්දැකීම් සම්භාරයක් ඇතුළුව පුරාණ දේශීය දැනුම පැවතීම ක්‍රමයෙන් අඩු වී ඇත. නිදහසින් පසුව පවා ශ්‍රී ලංකා රජයන් යටත් විජිත ආර්ථික ව්‍යුහය සමඟ ඉදිරියට යෑමට කැමැත්තක් දැක්වූහ. නිදසුනක් වශයෙන් නාගරීකරණය තිරිඟු පරිභෝජනයට ධනාත්මක බලපෑමක් ඇති කර ඇති අතර ශ්‍රී ලංකාවේ සහල් පරිභෝජනයට අහිතකර ලෙස බලපා ඇති බව පෙන්නුම් කර ඇත. සුපිරි වෙළඳසැල්වල වර්ධනයට සමගාමීව ශ්‍රීලංකාව පසුගිය දශකය තුළ විශාල නගරවලට සේවය කරන බටහිර ක්ෂණික ආහාර දාමවල සීඝ්‍ර වර්ධනයක් නිරීක්ෂන කර ඇති අතර ඒවා කුඩා නගර කරා ව්‍යාප්ත වෙමින් පවතියි.

බටහිර සෞඛ්‍යට අහිතකර ආහාර රටාවන්ගේ බලපෑම අවම කිරීම සඳහා කෘෂිකරම අමාත්‍යාංශය ඓතිහාසික සංධිස්ථානයකට පැමිණ ඇත්තේ ශ්‍රී ලාංකිකයන් අතර සාම්ප්‍රදායික හා දේශීය ආහාර නැවත හඳුන්වා දීමෙනි. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ආහාර, දේශීය ධාන්‍ය

වර්ග, මුල්,අල ,කොළ, පලතුරු සහ එළවළු ඇතුලු විවිධ සෞඛ්‍යමය වාසි සමඟ සම්බන්ධ වී ඇති බවට සාධක ඇත.

සෞඛ්‍ය සම්පන්න නොවන බටහිර ආහාර වලින් විශේෂයෙන් තිරිඟුපිටි සංස්කෘතිය දේශීය ආහාර පිළිවෙත් වෙත සංක්‍රමණය කිරීම සඳහා මිනිසුන්ගේ මනස වෙනස් කිරීම පහසු කාර්යයක් නොවේ. මේ අනුව ගරු අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමාගේ සංකල්පයක් අනුව සම්ප්‍රදායික හා දේශීය ආහාර සංවර්ධනය කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා විවිධ ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් හඳුන්වාදීමත් සමඟ " අපි වවලයි - අපි කන්නේ" සංකල්පය අප විසින් ශක්තිමත් කර ඇත. නිදසුනක් වශයෙන්, විවිධ ආහාර ප්‍රදර්ශන සහ ආහාර උත්සව සමඟ බෝ නොවන රෝග වැළැක්වීමේ පියවරක් ලෙස ශ්‍රී ලාංකිකයන් අතර සාම්ප්‍රදායික ආහාර පිළිවෙත් ජනප්‍රිය කර අවබෝධ කර ගැනීමට අපි අදහස් කරමු. පුද්ගලික රාජ්‍ය හවුල්කාරිත්වය සමඟ නවෝත්පාදන තාක්ෂණ මැදිහත්වීම සමඟ අගය එකතු කළ ආහාර නිෂ්පාදනය, මණ්ඩලයේ නව ජයග්‍රහණයක්බවට පත්ව ඇති අතර කෘෂි ආහාරකර්මාන්තයසංවර්ධනයකිරීමෙන් පාරිභෝගිකයාටඋපරිම පෝෂණ ප්‍රතිඵල ලබාදීමට අපේක්ෂා කෙරේ.

එබැවින් අපගේ විවිධ ක්‍රියාකාරකම් වේගවත් කිරීමත් සමඟ අපේ රටේ සමෘධිය උදෙසා නුදුරු අනාගතයේ දී අපගේ කාර්යයන් ඉටු කිරීමට හැකි බව මට විශ්වාසයි.

නීතීඥබුද්ධිකඉද්දමල්ගොඩමහතා

ශ්‍රීලංකාජාතිකසාගිනිනිවීමේව්‍යාපාරමණ්ඩලය
(ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය)

මණ්ඩලයේ තොරතුරු

මණ්ඩලයේ නම:

ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය
(ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේව්‍යාපාර මණ්ඩලය)

පිහිටි ස්ථානය සහ නීතිමය ස්වරූපය:

1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ පනත මගින් ස්ථාපිත කර ඇත. 2009 වසරේ ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය ලෙස නම වෙනස් කිරීමට කැබිනට් අනුමැතිය ලැබුණි.

මූලික ක්‍රියාකාරකම් සහ අරමුණු:

ප්‍රධාන ලෙස ආර්ථික අසාධාරණත්වයට භාජනය වූ ජනතාවට සේවය සපයන ආයතනයකි. අරමුණු වන්නේ;

- රජය විසින් සකස් කරන ලද සංවර්ධන වැඩ පිළිවෙලට අනුකූලව සාමාජීය හා ආර්ථික සංවර්ධනය සඳහා විදේශීය, දේශීය නියෝජ්‍යත්ව වල ආධාර ලබා ගැනීම
- මහජනෝපකාර, සාමාජීය හා ආර්ථික සංවර්ධනය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී ආයතනවලට හා වෙනත් මණ්ඩලවලට සහාය වීම
- කෘෂිකාර්මික හා කාර්මික සංවර්ධනය කෙරෙහි යොමු වූ නිශ්චිත යෝජනා ක්‍රමවලට ආධාර කිරීම එම යෝජනා ක්‍රම දියුණු කිරීම සහ සම්බන්ධීකරණය කිරීම
- කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදනය වැඩි කිරීම සඳහා වූ යෝජනා ක්‍රියාත්මක කිරීමෙහිලා ආණ්ඩුවේ නොවූ නියෝජ්‍යත්ව උනන්දු කිරීම
- ජාත්‍යන්තර සාගිනි නිවීමේ ව්‍යාපාරය සහවෙනත් ඒ හා සමාන පිටරට ආයතන, සංගම් හෝ සමිති සමග සහයෝගී වීම

රේඛීය අමාත්‍යාංශය:

කෘෂිකර්ම අමාත්‍යාංශය

කාර්යාලය:

අංක 45, කිරිමණ්ඩල මාවත, කොළඹ 5.
දුරකථනය : 0112506895/0112505684
ෆැක්ස් : 0112506907
විද්‍යුත් ලිපිනය : ffhc.srilanka@gmail.com
වේබ් අඩවිය : www.nfpb.lk

විගණකවරු:

විගණකාධිපති දෙපාර්තමේන්තුව
අභ්‍යන්තර විගණන අංශය - කෘෂිකර්ම අමාත්‍යාංශය

බැංකුකරුවන්:

ලංකා බැංකුව - බොරැල්ල
මහජන බැංකුව - දෙහිවල

උපාය මාර්ග:

- සංවර්ධන මූලයන් සාමූහික අරමුණක් කෙරෙහි යොමු කිරීමට සමෝධානය කිරීම
- ගැමි ජනතාවට ආර්ථික සහ සමාජ වර්ධනයට, සහයෝගී වීම සඳහා අවස්ථාව ලබා දීම
- සංවර්ධන ක්‍රියාවලියට සහභාගීවීම සඳහා ගැමි ජනතාවට බලය ලබා දීම
- ස්වයං ප්‍රවලිත තිරසාර සංවර්ධනයක් ඇති කිරීම සඳහා පාරම්පරික ගැමි ජනතාවගේ ස්ව විශ්වාසය ඇති කිරීම සමඟ ලබා ගත හැකි අගයන් වෙත වෙනස් කිරීම
- දේශීය ආහාර භාවිතය සහ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම
- පසු අස්වනු හානිය අවම කිරීමේ තාක්ෂණයබිම් මට්ටම තෙක් රැගෙන යාම

සමස්ත කාර්යසාධනය - 2018

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ සංවර්ධන අංශය මඟින්මෙම වසරේදී ව්‍යාපෘති 10ක්ක්‍රියාත්මක කර ඇති අතර මෙම ව්‍යාපෘති වල සංක්ෂිප්තවාර්තාවක් පහතින් දැක්වේ.

මෙම ව්‍යාපෘති සිදු කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ වස විසෙන් තොර දේශීය ආහාර, අගය එකතු කළ ආහාර සහ දේශීය කෘෂි යෙදවුම් සහන මිලට පාරිභෝගිකයාට ලබා දී එමඟින් සෘජුව හා වක්‍රව දේශීය ගොවියාගේ ආර්ථික තත්වය නැංවීම හා සුළු හා මධ්‍යම පරිමාණ නිෂ්පාදකයින් සඳහා ඔවුන්ගේ නිෂ්පාදන දිරිමත් කිරීමෙන් ඔවුන් සවිබල ගැන්වීමයි.

1.පැල අලෙවිසැල - නාරාහේන්පිට

ග්‍රාමීය ජනතාවට මෙන්ම නාගරික වැසියන්ටද තම ගෙවත්තේ තමාට අවශ්‍ය දෑ හැකි අයුරින් වගා කර පරිභෝජනයට ගැනීමට පෙළඹීම මත ඒ සඳහා, ඒ සඳහා "වස විසෙන් තොර" ආහාර ප්‍රචලිත කිරීම අරමුණු වූ අප ආයතනය නාගරික වැසියන්ට ගෙවතු වගාව සඳහා අවශ්‍ය වන්නා වූ සියලුම වර්ගයේ එළවළු පැළ ඇතුළු සහනදායී මිලකට ලබාදීම පෙරදැරිව ආරම්භ කරන ලද ව්‍යාපෘතියක් ලෙස නාරහෙන්පිට පැළ තවාන හදුන්වාදිය හැක. ඖෂධීය පැල, මල් පැල හා පලතුරු පැල (විශේෂයෙන් ඌන භාවිත පලතුරු)හා පලතුරු හා එලවලු බීජ, එළවළු හා මල් පොහොර, කාබනික පොහොර, කෘමි විකර්ෂක, කෘෂි උපකරණ ආදිය මෙම ස්ථානයෙන් මිලට ගත හැකි අතර මෙම ස්ථානයෙන් බෝග වගා පිළිබඳ උපදෙස් ද නොමිලේ ලබා ගත හැක.

මෙම වසරේ මෙම ව්‍යාපෘතිය සඳහා මෙහෙයුම් වියදම රු. මි 9.335වන අතර මෙහෙයුම් ආදායම ලෙස රු. මි. 11.708 ලබාගෙන ඇත. එසේම වසරේ ශුද්ධ ලාභය රු. මි. 2.311කි. ඒ අනුව මෙම දත්ත අනුව පසුගිය වසරට වඩා මෙම ව්‍යාපෘතිය ප්‍රගතියක් ලබා ගෙන ඇත.



පැලතවානසහ අලවි සැල

2.පැලඅලෙවිසැල - දෙහිවල

දෙහිවල අලෙවිසැල මඟින් ද නාරාහේන්පිට අලෙවිසැල ඉටු කරන කාර්යයන් සපුරාලයි.

මෙම වසරේ මෙහෙයුම් ආදායම ලෙස රු.මි 6.288උපයා ඇති අතර රු.මි 5.565 කමෙහෙයුම්වියදමක් දරා ඇත. රු.මි 0.710ක මුදලක් ශුද්ධ ලාභය ලෙස ලබාගෙන ඇත.

3.ගොවි නිෂ්පාදන හාආහාරඅලෙවිසැල - දෙහිවල

ගොවිජනතාවගේනිෂ්පාදන, අගයඑකතුකරනලදදේශීයව්‍යවසායකයන්ගේනිෂ්පාදන, එමෙන්මආයතනයවිසින්සකස්කරනුලබනපාරම්පරිකසහල්වර්ග (සුවදැල්, කළුහීනටි, පච්චපෙරුමාල්යනාදීසහල්ප්‍රභේද),මව්පෝෂ, සුවපෝෂ (පෝෂණීයආහාර), තෝසේපිටිමිශ්‍රණය,

විශේෂසහල්පිටිමිශ්‍රණයයනාදීවසවිසෙන්තොරආහාරවර්ගප්‍රචලිතකිරීමේඅරමුණින්මෙමව්‍යාපෘතියආරම්භකොටක්‍රියාත්මකවෙමින්පවතී.
එසේමමෙයටඅනුබද්ධිතවක්‍රියාත්මකආපනශාලාවමගින්උදැසනභාදහවල්,පෝෂණීයභාගුණාත්මකආහාරවර්ගජනතාවටසහනමිලටලබාදීමටකටයුතුයොදාඇත.
මෙම වසරේ මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් වියදම රු. මි 41.649කි. මෙහෙයුම් ආදායම රු. මි41.024 කි.

4.බුත්තල සහ තණමල්විල ගොවිපල සංවර්ධනය

බුත්තලගොවිපල (පොහොරනිෂ්පාදනය)

බුත්තල හා තණමල්විල යන ප්‍රදේශයන්හී 1986 වසරේ සිට පටන් ගොවිපළ සංවර්ධන ව්‍යාපෘතිය අද දක්වා ක්‍රියාත්මක වෙමින් පවතී.බුත්තල ගොවිපළහි 2017 වසර ආරම්භ කරන ලද නියමු ව්‍යාපෘතියක් ලෙස කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යාපෘතිය හැදින්විය හැකිය.මෙහි කොම්පෝස්ට් පොහොර, කොහුබත් හා බදුන් මිශ්‍රණ යනාදී පොහොර වර්ග නිෂ්පාදනය සාර්ථකව සිදු කරමින් පවතී.
එසේ නිපදවනු ලබන පොහොර වර්ග අප ආයතනය සතු අළෙවිසැල් හරහා සධාරණ මිලකට ජනතාවට සපයනු ලැබේ.

2018වර්ෂයේදී මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් ආදායම රු. මි. 2.571 ක් වන අතර මෙහෙයුම් වියදම රු. මි 2.527ක් වේ.මෙම වසරේ රු.මි 0.176 ක ශුද්ධ ලාභයක් ලබාගෙන තිබේ.

තණමල්විල ගොවිපල

ප්‍රදේශයේ සාගිනි පවුල් වලද සහභාගිත්වයෙන් තණමල්විල ගොවිපල ආදර්ශ ගොවිපලක් ලෙස පවත්වා ගෙන යන අතර කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය ද සිදු කරමින් පවතී. 2018 වසරේ තණමල්විල ගොවිපලේ මෙහෙයුම් වියදම රු. මි 0.475 කි. මෙහෙයුම් ආදායම රු. මි. 0.116 කි.

5.සුවපෝෂ පෝෂණීය ආහාරය, සහල් පිටි, තෝසේ පිටි, මව්පෝෂ ව්‍යාපෘතිය

සහල්පිටිසහතෝසේපිටි

සහල් පිටි භාවිතය ජනතාව අතර ප්‍රචලිත කිරීම පෙරදැරිව ආරම්භ කරන ලද ව්‍යාපෘතියක් ලෙස සහල් පිටි ව්‍යාපෘතිය හැදින්විය හැකිය. මෙම ව්‍යාපෘතිය ආයතනයට අයත් පේරාදෙණිය ගන්නොරුව කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කටයුතු සිදුකරයි. මෙයට සමගාමීව තෝසේ පිටි ව්‍යාපෘතියක්ද ක්‍රියාත්මක කෙරේ.මේ සදහා 2018 වර්ෂයේදී මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් ආදායම රු. මි. 0.553ක් වන අතර මෙහෙයුම් වියදම රු. මි 0.848වේ.



සුවපෝෂ හා මව්පෝෂ ව්‍යාපෘතිය

බර අඩු ගර්භණී කාන්තාවන්ට පෝෂණ මල්ලක් ලබාදීමේ සඳහා ආරම්භකරන ලද මෙම ව්‍යාපෘතිය පසුව සුවපෝෂ හා මව්පෝෂ ලෙස නාමයන් යටතේ අප ආයතනය සතු අළෙවිසැල් සහ අනුබද්ධ ආයතන හරහා සාධාරණ මිලකට අළෙවි කෙරේ.මේ සඳහා වර්ෂයේදී මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් ආදායම රු. මි. 1.156ක් වන අතර මෙහෙයුම් වියදම රු. මි 2.53වේ.

6.ඌනභාවිත පළතුරු භාවිතා කරමින් පළතුරු බීමනිෂ්පාදනය කිරීම

ඌනභාවිත පළතුරු පරිභෝජනය ජනතාව අතර ප්‍රචලිත කිරීම හා අගය එකතු කළ නිෂ්පාදනයන් හඳුන්වාදීමේ අරමුණින් යුතුව මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. මෙහිදි වෙරළු, අනෝදා සහ වල් අඹ මූලිකව පළතුරු ලෙස යොදා ගන්නා අතර ගන්නොරුව ආහාර පර්යේෂණ ඒකකයේ මෙම බීම නිෂ්පාදනය කෙරේ.මේ සඳහා 2018 වර්ෂයේදී මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් ආදායම රු. මි. 0.361ක් වන අතර මෙහෙයුම් වියදම රු. මි 0.712වේ.



පළතුරු බීම සැකසීම



සකස් කරනලද පළතුරු බීමබෝතල්

7.පාරම්පරිකවීමිලදීගැනීමේව්‍යාපෘතිය

නිරෝගී දිවිය හා සැමට ආහාර යන තිරසාර සංවර්ධන අරමුණු ලගා කර ගැනීම සඳහා පාරම්පරික සහල් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. ශ්‍රී ලංකාව පුරා පැතිරි යන බෝ නොවන රෝග වලින් වැලකීම සඳහා මෙම සහල් පරිභෝජනය වැදගත් වේ. මෙම සහල් පරිභෝජනය මඟින් නිරෝගි ජනතාවක් බිහිවීමත් දේශීය ගොවීන් සවිබල ගැන්වීමත් සිදු වේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාරම්පරික වී වගා කරන ගොවීන්ගෙන් වී සාධාරණ මිලට මිලදී ගෙන කලංකුට්ටිය කර්මාන්ත ශාලාවේදී ඒවා සහල් බවට පත් කර දෙහිවල, නාරාහේන්පිට අලෙවිසැල් සහ පෞද්ගලික අංශය මඟින් අලෙවි කිරීම සිදු කරයි. මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් වියදම රු. මි 1.677කි. ආදායම රු. මි0.636වේ.





8. සෝයා ආශ්‍රිත අගය එකතු කළ ආහාර නිෂ්පාදන ව්‍යාපෘතිය

ප්‍රෝටීන, ලිපිඩ, ඛනිජලවණඟාවිටමින්වලින්පරිපූර්ණ ආහාරයක් වන සෝයා බෝංචි ආශ්‍රිත කොට පෝෂණ ගුණයෙන් අනූන අධික රුධිර පීඩනය හා දියවැඩියාව ඇතුළු බෝ නොවන රෝග වලින් පෙලෙන බාල මෙන්ම තරුණ, මහළු සැමට ගුණදායක සෝයා ආශ්‍රිත අගය එකතු කළ ආහාර නිෂ්පාදන සමාජය වෙත ඉදිරිපත් කිරීම මෙහි අභිමතාර්ථය වේ. සෝයා වල පවතින අමිහිරි රසය සහ සුවඳ විද්‍යානුකූලව ඉවත්කොට මෙම කෘත්‍යමය ආහාර පාරිභෝගිකයන් වෙත ඉදිරිපත් කරනු ලැබේ. මේ සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් රු.මි. 0.670 ක ප්‍රතිපාදන ලැබීඇත.

මෙමනිෂ්පාදන ඉදිරියේදී රාජ්‍ය හා පෞද්ගලික ව්‍යවසායකත්වය යටතේ දිවයින පුරා ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වේ.





සෝයා ආශ්‍රිත බිස්කට් සැකසීම

9.බඩඉරිඟු ආනයනය කිරීම

පාරිභෝගිකයන්ගේ දැඩි ඉල්ලුම පරිදි ශ්‍රී ලංකාවේ කුකුළු මස් සහ බිත්තර නිෂ්පාදනය සඳහා කුකුලන්ගේ ආහාරයේ ප්‍රධාන සංඝටකයක් ලෙස බඩඉරිඟු අවශ්‍ය වේ. නමුත් පවතින තත්වය තුළ ශ්‍රී ලංකාවේ නිපදවනු ලබන්නේ බඩඉරිඟු මෙ.ටො200,000 වන අතර.එය වාර්ෂික අවශ්‍යතාවයෙන් 50% ක් පමණය.

දැනටබඩඉරිඟුආනයනයපෞද්ගලික සමාගම් හරහා සිදු කරන අතර ඔවුන් ඒ සඳහා ඒකාධිකාරියක් පවත්වා ගෙන යෑම තුළ කුකුළු ආහාර නිෂ්පාදන වල මිල ඉහළ යෑමෙන් පාරිභෝගිකයා දැඩි අසීරුතාවයකට පත් වී ඇත. මෙම තත්වය නියාමනය කිරීම සඳහා ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාගේ මහපෙන්වීම යටතේ සත්ත්ව ආහාර සඳහා මෙ.ටො.50,000ක් ආනයනය කිරීම සඳහා අවසර ලබා දෙන ලදී. මේ සඳහා පුද්ගලික අංශයේ ව්‍යවසායකත්ව දායකත්වයෙන් යුතුව බඩඉරිඟු ආනයනය කළ අතර එයින් මෙ.ටො.37,000ක් ආනයනය කරන ලද අතර උපයාගත් ආදායම රු.මි.1929.82 සහ ශුද්ධ ලාභය රු.මි.41.07 කි.

10. දේශීය බඩ ඉරිඟු මිලදී ගැනීම

අතිරේක ආහාර භෝග ප්‍රවර්ධන වැඩසටහනක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කයේ හා මොනරාගල දිස්ත්‍රික්කයේ බඩ ඉරිඟු ගොවීන් දිරි ගැන්වීමඅරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.
මෙමගින් අප ආයතනය විසින් බඩඉරිඟු ගොවීන්ගේ අස්වැන්න නිසිකලට මිලට ගෙන ඔවුන්ගේ ගොවි අස්වනු සඳහා නිශ්චිත මිලක් හා වෙළඳ පොලක් නිර්මාණය කිරීමට හැකිවිය.
මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් වියදම රු. මි2.635කි. ආදායම රු. මි2.410 වේ.

11.භාණ්ඩාගාරප්‍රතිපාදන

	අයවැයප්‍රතිපාදන 2018(රු.මි.)	ලැබුන ප්‍රදානයන් (රු.මි.)	සත්‍යවියදම (රු.මි.)	වැඩිවියදම (රු.මි)
පුනරාවර්තන	80.236	46.400	63.686	33.836
ප්‍රාග්ධන	8.000	8.000	4.545	3.455
එකතුව	88.236	54.400	68.231	37.291

12.වෙනත්ප්‍රතිපාදන

(කෘෂිකර්ම අමාත්‍යාංශය, කෘෂිකර්මදෙපාර්තමේන්තුව සහ ලෝක ආහාර වැඩසටහන)

	මුදල (රු. මී)
පුනරාවර්තන	6,960,496.67
ප්‍රාග්ධන	-
එකතුව	6,960,496.67

2018 වාර්ෂික ගිණුම් වාර්තාව

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය

මෙම මූල්‍ය තත්වය ප්‍රකාශනය සහ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සාමාන්‍ය පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සකස් කර ඇති අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව, ඓතිහාසික පිරිවැය පදනම මත සහ අඛණ්ඩ පැවැත්ම පදනම මත පිහිටා සකස් කර ඇත.

ගිණුම්කරණ ප්‍රතිපත්ති:

- ක්ෂය ගණනය කිරීම්, වත්කම් මිලදී ගත් දිනයේ සිට සිදුකරන අතර සියලුම වත්කම් ඵලදායි ජීවිත කාලය පුරා ක්ෂය කර ඇත.

- ලැබිය යුතු ශේෂ සඳහා බොල් සහ අඩමාන ණය සඳහා වෙන් කිරීම් සිදුකර ඇත.

- හඳුනාගත් සියලුම වගකීම් සඳහා වෙන් කිරීම් කර ඇත.

- පාරිතෝෂික සඳහා වෙන් කිරීම් ගණනය කර ඇත්තේ පාරිතෝෂිත හිමි එක් එක් සේවකයන්ගේ සේවා කාලය පදනම් කර ගනිමිනි.

- වියදම් ඉක්මවා ගිය ආදායම් ගණනය කර ඇත්තේ දන්නා සියලුම වගකීම් සඳහා වෙන් කිරීම් සිදුකළ පසුවය.

- තොග ගණනය කරනු ලබන්නේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් වඩා අඩු අගයට වන අතර, පහත සඳහන් තොග සඳහා පිරිවැය පහත සඳහන් ක්‍රම යටතේ ගණනය කරනු ලබයි.

    - අමුද්‍රව්‍ය - ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමයට සත්‍ය පිරිවැයට පෙන්වනු ලබයි.
    - නොනිමි තොග - සෘජු අමුද්‍රව්‍ය පිරිවැයට පෙන්වනු ලබයි
    - නිමි තොග - සෘජු අමුද්‍රව්‍ය,විචල්‍ය පොදුකාර්ය පිරිවැය සහ සෘජු වැටුප් ඇතුළත්ව සත්‍ය පිරිවැයට පෙන්වනු ලබයි.
    - පාරිභෝගික ද්‍රව්‍ය - සත්‍ය පිරිවැය පෙන්වනු ලබයි.

- රජයෙන් ලද ප්‍රතිපාදන ආදායම් ප්‍රකාශනයේ ආදායමක් ලෙස වෙන්කර පෙන්වා ඇති අතර වියදම් අයිතමයන්ද වෙන්කර ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය

1.2018 වර්ෂය තුළ දී ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

ව්‍යාපෘතිය	අරමුදල් ලබා දුන්නේ	ව්‍යාපෘතිය පිහිටි ස්ථානය
ගොවිපල සංවර්ධනය - තණමල්විල	ස්ව අරමුදල්	තණමල්විල
ගොවිපලසංවර්ධනය- බුත්තල	ස්ව අරමුදල්	බුත්තල
පාරම්පරික සහල් ව්‍යාපෘතිය	ස්ව අරමුදල්	කලංකුට්ටිය
පැල තවාන - දෙහිවල	ස්ව අරමුදල්	දෙහිවල
පැල තවාන -නාරාහේන්පිට	ස්ව අරමුදල්	නාරාහේන්පිට
සෝයා ආශ්‍රිත අතුරු නිෂ්පාදන ව්‍යාපෘතිය	කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව	ගන්නෝරුව
සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය	ගොවි භාරකාර අරමුදල	හම්බන්තොට
සහල් සබලකරණ ව්‍යාපෘතිය	ලෝක ආහාර වැඩසටහන	කලංකුට්ටිය
පළතුරු බීමව්‍යාපෘතිය	ස්ව අරමුදල්	ගන්නෝරුව
දේශීය බඩඉරිඟු මිලදී ගැනීමේ ව්‍යාපෘතිය	ගොවි භාරකාර අරමුදල	බුත්තලසහ ගලෙන්බිදුනුවැව
බඩඉරිඟු ආනයනය	ස්ව අරමුදල්	ප්‍රධාන කාර්යාලය
සහල් පිටි ව්‍යාපෘතිය	ස්ව අරමුදල්	කලංකුට්ටිය
සෝයාව්‍යාපෘතිය	ස්ව අරමුදල්	උපුල්දෙණිය
සුවපෝෂපෝෂණව්‍යාපෘතිය	ස්ව අරමුදල්	ගන්නෝරුව
මව්පෝෂ පෝෂණ ව්‍යාපෘතිය	ස්ව අරමුදල්	ගන්නෝරුව
කාබනික පොහොර ව්‍යාපෘතිය	ස්ව අරමුදල්	බුත්තල
දෙහිවල ගොවි අලෙවිසැල	ස්ව අරමුදල්	දෙහිවල
ආහාර සැණකෙළිය - 2018	ස්ව අරමුදල්, කෘෂිකර්ම අමාත්‍යාංශය	ග්‍රීන් පාත්- කොළඹ

.

2.ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය යටතේ පහත සඳහන් ජංගම ගිණුම් මෙමවසරේදී පවත්වා ගෙන යන ලදී.

194125	-	භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදන. කෘෂිකර්ම අමාත්‍යාංශය, ලෝක ආහාර වැඩසටහන සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලැබෙන ප්‍රතිපාදන බුත්තල ගොවිපල සංවර්ධනය, තණමල්විල ගොවිපල සංවර්ධනය,සුවපෝෂ ව්‍යාපෘතිය, මව්පෝෂ ව්‍යාපෘතිය,වතුකරයේ සහල් පිටි භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය, පැල තවාන, දෙහිවල අලෙවිසැල, කොම්පොස්ට් ව්‍යාපෘතිය, බඩඉරිහු ව්‍යාපෘතිය, පාරම්පරික සහල් ව්‍යාපෘතිය, පළතුරු බීම ව්‍යාපෘතිය, සහල් සබලකරණ ව්‍යාපෘතිය
337100196138295	-	දෙහිවල අලෙවිසැලේ ආදායම
80681636	-	සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය

3.සෑම ව්‍යාපෘතියක් සඳහාම වෙන වෙනම ලෙජර් පවත්වා ගෙන යනු ලබයි.

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය
2018 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

විස්තරය	සටහන	2018 රු.	2017 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත සහ යෙදවුම්	**1**	**344,138,329.70**	**339,966,422.68**
ඉඩම්		307,200,000.00	307,200,000.00
ගොඩනැගිලි		17,312,402.62	15,505,012.13
මෝටර් වාහන		6,910,136.99	3,376,116.44
යන්ත්‍රෝපකරණ හා යන්ත්‍ර සූත්‍ර		4,585,213.84	5,829,684.51
ලී බඩු සහ සවි කිරීම්		1,337,168.62	1,095,382.81
කාර්යාල උපකරණ		1,621971.38	1,388,060.88
කෘෂිකාර්මික උපකරණ		321,741.92	1,44,000.00
උද්‍යාන උපකරණ		188,793.47	251,704.03
වෙනත් උපකරණ		919,155.04	1,346,999.33
පරිගණක උපාංග		1,214,319.22	1,012,612.21
තාවකාලික ගොඩනැගිලි		1,791,989.53	1,903,988.87
මිනුම් උපකරණ		127,637.07	184,761.47
අස්පෘශ්‍ය වත්කම්			
මෘදුකාංග		607,800.00	728,100.00
මූල්‍ය වත්කම්		**136,536,633.46**	**93,969,576.67**
ඉතුරුම් තැන්පතු		659,760.99	196,000.16
ස්ථීර තැන්පතු		124,138,311.19	93,553,075.19
ආපදා ණය		11,738,561.28	220,501.32
ජංගම වත්කම්		**213,841,986.50**	**47,118,804.59**
තැන්පතු		519,361.50	111,816.50
තොගය		4,353,851.68	15,225,417.73
ණය ගැතියෝ		974,162.77	716,862.77
ඉදිරියට කළ වියදම්		-	1,445,668.16
ලැබිය යුතු මුදල්		156,190,229.16	16,082,465.12
අතැති සහ බැංකු මුදල්		51,804,426.39	13,536,574.31
මුළු වත්කම්		**694,516,949.66**	**481,054,803.94**
හිමිකම් හා වගකීම්			
ප්‍රාග්ධනය හා සංචිතය		**432,038,321.71**	**377,315,712.04**
අරමුදල් ශේෂය		390,703,946.72	377,703,946.72
ඒකාබද්ධ අරමුදල		41,334,374.99	(388,234,68)
ජංගම නොවන හිමිකම්		**6,609,807.00**	**6,898,935.50**
විශ්‍රාම පාරිතෝෂික වගකීම්		6,609,807.00	5,198,935.50
මධ්‍ය කාලීන ණය		-	1,700,000.00
ජංගම වගකීම්		**255,868,820.95**	**96,840,156.40**
රඳවාගත් අරමුදල		530,142.68	395,852.40
ආපසු ගෙවිය යුතු තැන්පතු		94,879,249.45	83,248,149.90
උපචිත වියදම්		160,459,428.82	13,196,154.10
මුළු හිමිකම් හා වගකීම්		**694,516,949.66**	**481,054,803.94**

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය
2018 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

විස්තරය	සටහන්	2018 රු.	2017 රු.
ආදායම්		**118,368,503.17**	**100,221,233.87**
භාණ්ඩාගාර/අමාත්‍යාංශ ප්‍රතිපාදන	**05,06**	53,360,496.67	44,532,882.42
වෙනත් මෙහෙයුම් ආදායම්	**02**	53,189,348.17	49,578,684.51
ඉතිරිකිරීම් ගිණුම් වල පොලිය		8,703,630.83	4,902,736.94
වත්කම් ඉවත් කිරීමෙන් ලද මුදල		-	
වත්කම් විකුණුම් මුදල් භාණ්ඩාගාරය වෙතසම්ප්‍රේෂණය කිරීම		-	
වෙනත් ආදායම්		3,115,027.50	1,206,930.00
වියදම්		**76,428,459.26**	**62,748,852.41**
පුද්ගල වේතන		40,038,956.82	37,404,501.50
ගමන් වියදම්		541,709.20	697,189.09
සැපයුම් සහ අවශ්‍යතා		3,786,562.89	2,340,711.10
ස්ථාවර වත්කම් අලුත්වැඩියාව සහ නඩත්තුව		4,402,944.59	7,602,947.76
පරිවර්තන, සන්නිවේදන,උපයුක්ත සහ වෙනත් සේවාවන්		27,658,285.76	14,703,502.96
වියදම් ඉක්ම වූ ආදායම/ අතිරික්තය (ඌනතාවය)		**41,940,043.91**	**37,472,381.46**

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය
2018 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සටහන	**2018** රු.	**2017** රු.
මෙහෙයුම් ක්‍රියාවන් මඟින් (භාවිතා කරන) /ලැබෙන මුදල් ප්‍රවාහ			
ආදායම් බදු වලට පෙර ශුද්ධ ලාභය / අලාභය		41,940,043.91	37,472,381.46
ගැලපුම්			
ක්ෂය කිරීම්	1	5,882,808.65	4,800,502.63
වාහන ඉවත් කිරීම් / මාරු කිරීම් ක්ෂය		(100,00.00)	-
දේපල පිරියත සහ උපකරණ ඉවත් කිරීම්/ මාරු කිරීම්			
ගොවීන්ගේ ණය කපා හැරීම්		-	-
අයෝජන ක්‍රියාකාරකම් මඟින් ඉපැයූ පොලී ආදායම		(8,611,574.83)	4,902,736.94
තැන්පතු			90,000.00
පෙර කාල පරිච්ඡේදයේ ගැලපුම්		(217,434.24)	3,268,553.20
විශ්‍රාමික පාරිතෝෂික සඳහා වෙන් කිරීම්			
විශ්‍රාමික ප්‍රතිලාභ සඳහා වෙන් කිරීම්		1,410,871.50	1,323,650.68
කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය		**40,304,714.99**	**51,857,824.91**
තොගය (වැඩිවීම්)/ අඩුවීම්		10,871,566.05	1,036,873.46
පාරිතෝෂික ගෙවීම්			
වෙළඳ සහ වෙනත් ලැබීම් (වැඩිවීම්)/ අඩුවීම්		(139,326,895.88)	(6,699,383.11)
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දේ වල වැඩි කිරීම් / අඩුකිරීම්		159,028,664.55	77,850,083.61
මෙහෙයුම් මඟින් ජනනය වූ මුදල්		30,573,334.72	72,187,573.96
මෙහෙයුම් ක්‍රියාකාරකම් මඟින් ලද ශුද්ධ මුදල්		**70,878,049.71**	**124,045,398.87**
ආයෝජන ක්‍රියාකාරකම් මඟින් ලැබුණු (භාවිතා කළ) / මුදල් ප්‍රවාහය			
දේපල, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම්	1	(5,054,715.67)	(7,371,176.13)
දේපල, පිරියත සහ උපකරණ ඉවත් කිරීම්/ මාරු කිරීම්		100,000.00	-
ආයෝජන ක්‍රියාකාරකම් / (භාවිතා කළ) මගින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		8,611,574.83	(4,902,736.94)
ඉතුරුම් තැන්පතු වැඩිවීම / අඩුවීම		(463,760.83)	610,118.68
ස්ථාවර තැන්පතු වැඩිවීම / අඩුවීම		(47,140,717.93)	(397,303,075.19)
ස්ථාවර තැන්පතු වැඩිවීම / අඩුවීම		16,555,481.93	303,750,000.00
වාහන විකුණුම් ආදායම් මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම		-	-
ආයෝජන ක්‍රියාකාරකම් / (භාවිතා කළ) මගින් ලද ශුද්ධ මුදල්		**(27,392,137.67)**	**(105,216,869.58)**
මූල්‍ය ක්‍රියාකාරකම් මඟින් ලද / (භාවිතා කළ මුදල් ප්‍රවාහය			
අරමුදල් ලැබීම්		54,400,000.00	47,440,932.42
ආධාර මුදල්		(46,400,000.00)	(44,532,882.42)
ආපදා ණය ගෙවීම්		(12,262,480.00)	(248,064.00)

ආපදාණය නැවත ගෙවීම්		744,420.04	27,562.68
ණය ආපසු ගෙවීම්		(11,700,00.00)	(13,200,000.00)
ණය ලැබීම්		10,000,000.00	5,000,000.00
		(5,218,059.96)	**(5,512,451.32)**
මුදල් සහ මුදල් වලට සමාන දේ වල ශුද්ධ වැඩිවීම් / (අඩුවීම්)		38,267,852.08	13,316,077.97
වර්ෂය මුලදී තිබූ මුදල් සහ මුදල් වලට සමාන දේ		13,536,574.31	220,496.34
වර්ෂය අවසානයේදී තිබූ මුදල් සහ මුදල් වලට සමාන දේ		51,804,426.39	13,536,574.31
සටහන - A			
බැංකු ශේෂය		51,804,426.39	220,496.34
සුළු මුදල්		-	-
අත ඉතිරි මුදල්		-	-
		51,804,426.39	**220,496.34**

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය
2018 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

	ප්‍රත්‍යාගණන අරමුදල රු.	අරමුදල් ශේෂය රු.	ඒකාබද්ධ අරමුදල රු.	එකතුව රු.
01.01.2018 දිනට ශේෂය	328,671,316.14	49,032,630.58	(388,234.68)	377,315,712.04
ලැබුණු අරමුදල්		54,000,000.00		54,000,000.00
ආධාර මුදල්		(46,400,000.00)		(46,400,000.00)
පෙර කාලවිශේෂ ගැලපීම්		-	(217,434.24)	(217,434.24)
ඌන වෙන් කිරීම්	5,000,000.00	-	-	5,000,000.00
ශුද්ධ අතිරික්තය / (ඌනතාවය)			41,940,043.91	41,940,043.91
	333,671,316.14	**57,032,630.58**	**41,334,374.99**	**432,038,321.71**

සටහන01
ජංගම නොවන වත්කම්

වත්කම් වර්ගය	ඉඩම් සහ ගොඩනැගිලි	මෝටර් වාහන	යන්ත්‍රෝපකරණ සහ උපකරණ	කාර්යාලීය උපකරණ	ලී බඩු සහ සවි කිරීම්	කෘෂි උපකරණ	උද්‍යාන උපකරණ	වෙනත් උපකරණ	ඡායාරූප සහ සිනමා උපකරණ	තාවකාලික ගොඩනැගිලි	මැනීම් උපකරණ	පරිගණක උපකරණ	මෘදුකාංග	එකතුව
2018.01.01 දිනට ශේෂය	322,705,012.13	3,376,116.44	5,829,684.51	1,388,060.88	1,095,382.81	144,000.00	251,704.03	1,346,999.33	-	1,903,988.87	184,761.47	1,012,612.21	728,100.00	339,966,422.68
එකතු කිරීම්	2,773,729.74	5,000,000.00	200,583.00	682,470.95	514,052.00	263,000.00	23,979.98	-	-	-		596,900.00	-	10,054,715.67
ඉවත් කිරීම් / මාරු කිරීම්(ස්ථාවර වත්කම්)	-	-	(100,000.00)	-	-	-	-	-	-	-	-	-	-	(100,000.00)
ඉවත් කිරීම්/ මාරු කිරීම්(සමුච්චිත ක්ෂය කර ඇති අගයන්)	-	-	100,000.00	-	-	-	-	-	-	-	-	-	-	100,000.00
වර්ෂය සඳහා ක්ෂය වීම්	(966,339.25)	(1,465,979.45)	(1,445,053.67)	(448,560.45)	(272,266.19)	(85,258.08)	(86,890.54)	(427,844.29)	-	(111,999.34)	(57,124.40)	(395,192.99)	(120,300.00)	(5,882,808.65)
ශුද්ධ ප්‍රත්‍යාගණනය	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
2018.12.31 දිනට ශුද්ධ අගය	**324,512,402.62**	**6,910,136.99**	**4,585,213.84**	**1,621,971.38**	**1,337,168.62**	**321,741.92**	**188,793.47**	**919,155.04**	**-**	**1,791,989.53**	**127,637.07**	**1,214,319.22**	**607,800.00**	**344,138,329.70**
ප්‍රත්‍යාගණන අතිරික්තයේ එකතුව	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
ප්‍රත්‍යාගණන ඌණතාවයේ එකතුව	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
දළ ධාරණ වටිනාකම	328,230,573.05	12,302,500.00	7,810,393.00	3,300,092.73	2,581,957.98	902,500.00	421,969.98	2,740,400.00	3,540.00	2,239,986.89	279,412.00	2,902,860.00	1,089,000.00	364,805,185.63
සමුච්චිත ක්ෂය වීම්	(3,718,170.43)	(5,392,363.01)	(3,225,179.16)	(1,678,121.35)	(1,244,789.36)	(580,758.08)	(233,176.51)	(1,821,244.96)	(3,540.00)	(447,997.36)	(151,774.93)	(1,688,540.78)	(481,200.00)	(20,666,855.93)
ශුද්ධ ධාරණ වටිනාකම	**324,512,402.62**	**6,910,136.99**	**4,585,213.84**	**1,621,971.38**	**1,337,168.62**	**321,741.92**	**188,793.47**	**919,155.04**	**-**	**1,791,989.53**	**127,637.07**	**1,214,319.22**	**607,800.00**	**344,138,329.70**

සටහන02 වෙළඳ හා ලාභ අලාභගිණුම්

පැල අලෙවි සැල - නාරාහේන්පිට
31.12.2018 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2018	2017
වෙළඳඅදායම	**11,708,988.55**	**10,707,540.40**
අඩකළා:විකුණුම් පිරිවැය		
ආරම්භකතොගය	1,037,884.50	717,087.84
මිලදීගැනීම්	7,832,613.85	7,577,655.59
තොග හානි	-	-
අවසානතොගය	(976,511.34)	(1,037,884.50)
	7,893,987.01	7,256,858.93
දළ ලාභය/අලාභය	**3,815,001.54**	**3,450,681.47**
පොදු කාර්යපිරිවැය	1,503,137.04	1,913,891.19
ශුද්ධලාභය/අලාභය	**2,311,864.50**	**1,536,790.28**

2.2

දෙහිවල අලෙවිසැල
31.12.2018න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2018 රු.	2017 රු.
වෙළඳ ආදායම	33,909,502.02	35,142,766.23
අඩුකලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	1,925,528.72	1,768,921.58
මිලදී ගැනීම්	29,059,394.70	30,448,180.84
ප්‍රවාහන	-	-
අවසාන තොගය	(1,787,477.83)	(1,925,528.72)
	29,197,445.59	30,291,573.70
දළ ලාභය/අලාභය	**4,712,074.43**	**4,851,192.53**
පොදු කාර්ය පිරිවැය	(5,779,637.17)	(6,520,792.54)
ශුද්ධලාභය/අලාභය	**(1,067,562.74)**	**(1,669,600.01)**

2.3 ආපනශාලාව - දෙහිවල

31.12.2018න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2018 රු.	2017 රු.
වෙළඳ ආදායම	**7,114,808.65**	**5,913,736.63**
අඩුකලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	48,541.00	39,498.30
මිලදී ගැනීම්	5,533,973.60	4,998,735.19
ප්‍රවාහන	-	-
අවසාන තොගය	(23,101.78)	(48,541.36)
	5,559,413.18	4,989,692.13
දළ ලාභය/අලාභය	**1,555,395.47**	**924,044.50**
පොදු කාර්ය පිරිවැය	(1,276,842.00)	(725,741.20)
ශුද්ධලාභය/අලාභය	**278,553.47**	**198,303.30**

2.4

පැල අලෙවි සැල - දෙහිවල
31.12.2018න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2018 රු.	2017 රු.
වෙළඳ ආදායම (පැළ සහපොහොර)	**6,288,143.00**	**5,828,989.49**
අඩුකලා: විකුණුම්පිරිවැය		
ආරම්භකතොගය	634,626.65	956,813.78
මිලදී ගැනීම්	4,574,456.25	3,830,118.64
තොග හානි	-	-
අවසානතොගය	(623,027.61)	(634,626.65)
	4,586,055.29	4,152,305.77
දළ ලාභය/අලාභය	**1,702,087.71**	**1,676,683.72**
පොදු කාර්යපිරිවැය	(991,542.18)	(1,063,950.10)
ශුද්ධලාභය/අලාභය	**710,545.53**	**612,733.62**

2.5 **සහල් පිටි ප්‍රවර්ධනයකිරීමේ ව්‍යාපෘතිය**

31.12.2018න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2018 රු.	2017 රු.
ආරම්භක තොගය	-	18,525.00
මිලදීගැනීම්	391,310.00	187,875.00
තොග හානි	-	-
අවසාන තොගය -අමුද්‍රව්‍ය	-	-
අමුද්‍රව්‍යපිරිවැය	391,310.00	206,400.00
ආරම්භක තොගය-නොනිමිවැඩ	-	124,440.00
තොග හානි	-	-
අවසාන තොගය-නොනිමිවැඩ	-	-
නිෂ්පාදනපිරිවැය	391,310.00	330,840.00
විකුණුම්ආදායම	**553,644.00**	**364,770.00**
අඩුකලා: විකුණුම්පිරිවැය		
ආරම්භකතොගය	71,167.84	70,229.80
නිෂ්පාදනවියදම	391,310.00	330,840.00
	462,477.84	401,069.80
තොගහානි	(32,396.21)	-
අවසානතොගය	(31,610.45)	(71,167.84)
	398,471.18	329,901.96
දළ ලාභය/අලාභය	**155,172.82**	**34,868.04**
පොදු කාර්ය පිරිවැය	(450,160.10)	(455,380.20)
ශුද්ධලාභය/අලාභය	**(294,987.28)**	**(420,512.16)**

2.6 **සුවපෝෂ**

31.12.2018න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභගිණුම

අයිතම	2018 රු.	2017 රු.
ආරම්භකතොගය	90,250.00	130,000.00
මිලදී ගැනීම්	22,300.00	97,225.00
තොග හානි	-	-
අවසාන තොගය-අමු ද්‍රව්‍ය	(30,000.00)	(90,250.00)
අමුද්‍රව්‍යපිරිවැය	82,550.00	136,975.00
ආරම්භකතොගය-නොනිමි වැඩ	-	-
අවසානතොගය-නොනිමි වැඩ	-	-
නිෂ්පාදනවියදම	82,550.00	136,975.00
විකුණුම්ආදායම	**80,205.00**	**190,610.00**
අඩුකලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	31,535.00	233.25
නිෂ්පාදනවියදම	82,550.00	136,975.00
	114,085.40	137,208.25
තොග හානි	(186.60)	-
අවසාන තොගය	(419.85)	(31,535.40)
	113,478.95	105,672.85
දළ ලාභය/ අලාභය	**(33,273.95)**	**84,937.15**
පොදු කාර්ය පිරිවැය	(442,933.10)	(440,335.70)
ශුද්ධ ලාභය/අලාභය	**(476,207.05)**	**(355,398.55)**

2.7 **මව්පෝෂ**

31.12.2018න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභගිණුම

අයිතම	2018 රු.	2017 රු.
ආරම්භක තොගය	842,150.00	271,555.00
මිලදී ගැනීම්	180,105.00	1,832,714.50
සෘජු වැටුප්	-	-
ප්‍රවාහන	-	-
තොග හානි	-	-
අවසාන තොගය- අමු ද්‍රව්‍ය	(9,115.00)	(842,150.00)
	1,016,840.00	1,262,119.50
ආරම්භක තොගය-නොනිමි වැඩ	-	-
අවසාන තොගය-නොනිමි වැඩ	-	-
නිෂ්පාදන පිරිවැය	1,016,840.00	1,262,119.50
වෙළඳඅදායම	**1,076,108.00**	**922,260.00**
අඩුකලා: විකුණුම් පිරිවැය		
ආරම්භකතොගය	56,266.06	68,394.08
නිෂ්පාදනවියදම	1,016,840.00	1,262,119.50
	1,073,106.06	1,330,513.58
තොගහානි	(2,982.30)	-
අවසාන තොගය	(795.28)	(56,266.06)
	1,069,328.48	1,274,247.52
දළ ලාභය/ අලාභය	**6,779.52**	**(351,987.52)**
පොදු කාර්යපිරිවැය	(905,502.70)	(1,039,062.89)
ශුද්ධලාභය/අලාභය	**(898,723.18)**	**(1,391,050.41)**

2.8 <u>කොම්පොස්ට් ව්‍යාපෘතිය -බුක්තල</u>

<u>31.12.2018</u>න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභගිණුම

අයිතම	2018 රු.	2017 රු.
ආරම්භක තොගය	356,342.20	234,349.80
මිලදී ගැනීම්	2,125,170.80	1,536,260.68
සෘජු වැටුප්	-	-
ප්‍රවාහන	-	-
අවසාන තොගය- අමු ද්‍රව්‍ය	(489,215.50)	(356,342.20)
	1,992,297.50	1,414,268.28
ආරම්භක තොගය-නොනිමිවැඩ	-	-
අවසාන තොගය-නොනිමි වැඩ	-	-
නිෂ්පාදන වියදම	1,992,297.50	1,414,268.28
වෙළඳ ආදායම	**2,571,350.00**	**1,612,750.00**
<u>අඩුකලා</u>: විකුණුම් පිරිවැය		
ආරම්භකතොගය	-	-
නිෂ්පාදනවියදම	1,992,297.50	1,414,268.28
අවසාන තොගය	-	-
	1,992,297.50	**1,414,268.28**
දළ ලාභය/ අලාභය	**579,052.50**	**198,481.72**
පොදු කාර්යපිරිවැය	(402,128.80)	(256,247.00)
ශුද්ධලාභය/අලාභය	**176,923.70**	**(57,765.28)**

2.9 **පාරම්පරික සහල්ව්‍යාපෘතිය**

31.12.2018න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	**2018** රු.	**2017** රු.
ආරම්භකතොගය	-	854,895.00
මිලදී ගැනීම්	465,537.80	424,843.55
ප්‍රවාහන	-	-
ඇඹරුම් පිරිවැය	-	-
සෘජු වැටුප්	-	-
තොග හානි	(13,750.00)	-
අවසාන තොගය	(150,216.87)	-
	301,570.87	1,279,738.55
ආරම්භක තොගය-නොනිමි වැඩ	-	1,013,841.00
තොග හානි	-	-
අවසාන තොගය-නොනිමි වැඩ	-	-
නිෂ්පාදන වියදම	301,570.87	2,293,579.55
වෙළඳ ආදායම	**636,149.00**	**1,936,915.00**
අඩුකලා:විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	-	1,097,800.00
නිෂ්පාදනවියදම	301,570.87	2,293,579.55
	301,570.87	3,391,379.55
තොග හානි	(2,380.00)	-
අවසාන තොගය	(5,400.00)	-
	293,790.87	3,391,379.55
දළ ලාභය/අලාභය	**342,358.13**	**(1,454,464.55)**
පොදු කාර්යපිරිවැය	(1,212,327.26)	(1,531,660.91)
ශුද්ධලාභය/අලාභය	**(869,969.13)**	**(2,986,125.46)**

2.10 <u>බුත්තල ගොවිපල</u>

<u>31.12.2018</u>න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභගිණුම

අයිතම	2018 රු.	2017 රු.
ආරම්භක තොගය	-	-
මිලදී ගැනීම්		
අවසාන තොගය- අමු ද්‍රව්‍ය	-	-
	-	-
ආරම්භක තොගය-නොනිමි වැඩ	-	-
අවසාන තොගය-නොනිමි වැඩ	-	-
නිෂ්පාදන වියදම	-	-
වෙළඳ ආදායම	**35,340.00**	**9,201.00**
<u>අඩුකලා</u>:විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	-	-
නිෂ්පාදනවියදම	-	-
අවසාන තොගය	-	-
	-	**-**
දළ ලාභය/අලාභය	**35,340.00**	**9,201.00**
පොදු කාර්යපිරිවැය	664,389.50	525,407.80
ශුද්ධලාභය/අලාභය	**(629,049.50)**	**(516,206.80)**

2.11 **තණමල්විල ගොවිපල**

31.12.2018න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභගිණුම

අයිතම	2018 රු.	2017 රු.
ගොවිපල ආදායම	**116,000.00**	**155,000.00**
අඩුකලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොග		
නිෂ්පාදනවියදම	-	-
අවසාන තොග	-	-
	-	**-**
දළ ලාභය/අලාභය	**116,000.00**	**155,000.00**
පොදු කාර්යපිරිවැය	(475,686.60)	(483,239.76)
ශුද්ධලාභය/අලාභය	**(359,686.60)**	**(328,239.76)**

2.12 **සෝයා ව්‍යාපෘතිය**

31.12.2018න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභගිණුම

අයිතම	2018 රු.	2017 රු.
වෙළඳ ආදායම	**8,444,880.00**	**75,404,780.00**
අඩුකලා: විකුණුම්පිරිවැය		
ආරම්භකතොග	10,130,705.00	8,631,729.50
මිලදීගැනීම්		72,656,438.72
ඇසුරුම්කිරීම		116,301.00
තොගසැකසුම් ගාස්තු	406,497.50	439,757.50
ධූමකරණවියදම		109,983.75
තොග හානි		-
අවසානතොග	(174,705.00)	(10,130,705.00)
	10,362,497.50	**71,823,505.47**
දළ ලාභය/අලාභය	**(1,917,617.50)**	**3,581,274.53**
පොදු කාර්ය පිරිවැය	610,069.66	(1,284,839.70)
ශුද්ධලාභය/අලාභය	**(2,527,687.16)**	**2,296,434.83**

2.13

දේශීය බඩඉරිඟු මිලදී ගැනීමේ ව්‍යාපෘතිය
31.12.2018න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභගිණුම

අයිතම	2018 රු.	2017 රු.
වෙළඳ ආදායම	**2,410,610.00**	**13,860.00**
අඩුකලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොග	-	56,551.00
මිලදී ගැනීම්	2,211,961.00	-
ඇසුරුම්කිරීම	66,771.98	-
ධූමකරණවියදම	18,000.00	-
තොග හානි	-	-
අවසාන තොග	-	-
	2,296,732.98	**56,551.00**
දළ ලාභය/අලාභය	**113,877.02**	**(42,691.00)**
පොදු කාර්ය පිරිවැය	**338,276.50**	**-**
ශුද්ධලාභය/අලාභය	**(224,399.48)**	**(42,691.00)**

2.15BFN ව්‍යාපෘතිය

31.12.2018 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභගිණුම

අයිතම	2018 රු.	2017 රු.
වෙළඳ ආදායම	**361,967.00**	**106,500.00**
අඩුකලා:විකුණුම් පිරිවැය		
ආරම්භක තොග	420.00	-
මිලදී ගැනීම්	173,265.48	54,480.00
ඇසුරුම්කිරීම	12,183.74	**-**
තොග හානි	**-**	**-**
අවසාන තොග	(560.00)	(420.00)
	185,309.22	**54,060.00**
දළ ලාභය/අලාභය	**176,657.78**	**52,440.00**
පොදු කාර්ය පිරිවැය	526,132.10	180,272.55
ශුද්ධලාභය/අලාභය	**(349,474.32)**	**(127,832.55)**

2.16

බඩඉරිහු (ආනයනය)ව්‍යාපෘතිය
31.12.2018න්අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභඅලාභ ගිණුම

අයිතම	2018 රු.	2017 රු.
වෙළඳ ආදායම	**1,929,827,773.90**	**1,754,284,010.64**
අඩුකලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොග		-
මිලදී ගැනීම්	1,887,997,331.20	1,718,240,745.73
ප්‍රවාහන		-
ඇසුරුම් කිරීම		61,027.27
තොග හානි		-
අවසාන තොග		-
	1,887,997,331.20	**1,718,301,773.00**
දළ ලාභය/අලාභය	**41,830,442.70**	**35,982,237.64**
පොදු කාර්ය පිරිවැය	754,871.35	895,090.74
ශුද්ධලාභය/අලාභය	**41,075,571.35**	**35,087,146.90**

වෙළඳලාභ/අලාභගිණුම්

ව්‍යාපෘතිය	2018		2017	
	දළ ලාභය/ (අලාභය)	ශුද්ධ ලාභය/(අලාභය)	දළ ලාභය/ (අලාභය)	ශුද්ධ ලාභය/ (අලාභය)
	රු.	රු.	රු.	රු.
දෙහිවල අලෙවිසැල	4,712,074.43	(1,067,562.74)	4,851,192.53	(1,669,600.01)
ආපනශාලාව - දෙහිවල	1,555,395.47	278,553.47	924,044.50	198,303.30
පැල අලෙවි සැල - නාරාහේන්පිට	3,815,001.54	2,311,864.50	3,450,681.47	1,536,790.28
පැල අලෙවි සැල - දෙහිවල	1,702,087.71	710,545.53	1,676,683.72	612,733.62
සහල් පිටි ව්‍යාපෘතිය - කලංකුට්ටිය	155,172.82	(294,987.28)	34,868.04	(420,512.16)
සුවපෝෂ ව්‍යාපෘතිය	(33,273.95)	(476,207.05)	84,937.15	(355,398.55)
මව්පෝෂ ව්‍යාපෘතිය	6,779.52	(898,723.18)	(351,987.52)	(1,391,050.41)
බුත්තල කොම්පොස්ට්	579,052.50	176,923.70	198,481.72	(57,765.28)
පාරම්පරික සහල් ව්‍යාපෘතිය	342,358.13	(869,969.13)	(1,454,464.55)	(2,986,125.46)
බුත්තල ගොවිපල	35,340.00	(629,049.50)	9,201.00	(516,206.80)
තණමල්විල ගොවිපල	116,000.00	(359,686.60)	155,000.00	(328,239.76)
සෝයා ව්‍යාපෘතිය	(1,917,617.50)	(2,527,687.16)	3,581,274.53	2,296,434.83
දේශීය බඩඉරිඟු මිලදී ගැනීමේ ව්‍යාපෘතිය	113,877.02	(224,399.48)	(42,691.00)	(42,691.00)
BFN ව්‍යාපෘතිය	176,657.78	(349,474.32)	52,440.00	(127,832.55)
බඩඉරිඟු (ආනයන) ව්‍යාපෘතිය	41,830,442.70	(41,075,571.35)	35,982,237.64	35,087,146.90
එකතුව	**53,189,348.17**	**36,855,712.11**	**49,578,684.51**	**30,782,532.94**

03 සෘජු සංවර්ධන වියදම් ආධාර මුදල් යටතේ දක්වා ඇත.

04 ප්‍රධාන කාර්යාලයේ පරිපාලනය සඳහා දැරූ සියලු වියදම් භාණ්ඩාගාර අරමුදල් යටතේ දරා ඇත.

05 භාණ්ඩාගාර අරමුදල්

විස්තරය	අයවැය ප්‍රතිපාදන	2018 සත්‍ය වියදම්	2018 වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන	ඉතිරිය / ඌනතාවය
පුනරාවර්ථන	80,236,200.00	63,686,036.80	46,400,000.00	33,836,200.00
ප්‍රාග්ධන	8,000,000.00	4,545,052.94	8,000,000.00	-
			54,400,000.00	

06 කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ව්‍යාපෘති සඳහා ලැබුණු අරමුදල් පහත සඳහන් පරිදි පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් ලෙස භාවිතා කරන ලදී.

විස්තරය	ප්‍රාග්ධන	පුනරාවර්තන	එකතුව
ව්‍යාපෘති	-	6,960,496.67	6,960,496.67
			6,960,496.67

භාණ්ඩාගාර ප්‍රතිපාදන (පුනරාවර්තන) 46,400,000.00
අමාත්‍යාංශප්‍රතිපාදන6,864,536.67
සෞඛ්‍යඅමාත්‍යාංශප්‍රතිපාදන95,960.00

53,360,496.67

07.අම්බලන්තොට ගොවිපලේ ඉදි කරන ලද වැට සඳහා ගෙවීමට නියමිත රු.3,209,728.53 ක මුදල සඳහා කොළඹ දිස්ත්‍රික් උසාවියේ නඩු අංක DMR 02401-13 යටතේ මේ වන විටත් විභාග වෙමින් පවතියි.
08.කුඩා වැව් සංවර්ධන ව්‍යාපෘතියෙන්ලද 81,269,260.00මුදලපහතආකාරයට2017සහ2018වර්ෂයන්හි, වැයපහතදැක්වෙනආකාරයටතැන්පතුවලින්අඩුකොටදක්වාඇත.

ආපසුගෙවියයුතුතැන්පතු රු. 81,269,260.00
2017වර්ෂයේවැයවූවියදම්රු.(1,445,668.16)
2018 වර්ෂයේවැයවූවියදම්රු.(1,924,927.39)
රු **77,898,664.45**

09.දෙහිවලපැළ අලෙවි සැල, දෙහිවල අලෙවිසැල හා දෙහිවල ආපනශාලාවේ ගිණුම්වෙන වෙනම පෙන්වා ඇත.
10. දේශීය සෝයා ව්‍යාපෘතිය යටතේ මිලදී ගනු ලැබූ, යම් ප්‍රමානයක අස්ථානගත වීම සම්බන්ධයෙන්, කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ මූලික පරීක්ෂණයක් පැවැත්වෙමින් පවතී.
11. ශ්‍රී ලංකා ජාතික සගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය සතුව තිබූ, දෙහි විජලන යන්ත්‍රය,

2017 වසරේදී බී වනිගසේකර මහතා හට භාර දෙන ලදී. එය මෙම වසරේ ගිණුම් වලින් ඉවත්කොට ඇත.

2018 විගණන වාර්තාව

.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. ඒජීඑල්/ඩී/එච්සීබී/01/18/16

මගේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2019 මැයි 15 දින

සභාපති,

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය.

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

FFHC BOARD
23 MAY 2019
581
No. 45, Kirimandala Mw., Narahenpita.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න,
විගණකාධිපති

පිටපත: 01. ලේකම්, කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය.

02. ලේකම්, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. ඒජීඑල්/ඩී/එච්සිබී/01/18/16

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2019 මැයි 15 දින

සභාපති,

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය.

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

සමාලෝචිත වර්ෂය තුළ ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලිය වූ රු. 2,005,156 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මහහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරවිකිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත්

නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව,
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග හා ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
2015 ජූලි 14 දිනැති 3/2015 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 371 (2) (ආ)	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා නොගෙන රු. 500,000 ක් අධ්‍යක්ෂකවරයෙකු වෙත බඩඉරිඟු මිලදී ගැනීමට ලබා දී තිබුණි. එසේ ලබාගත් අත්තිකාරම් මුදල නියමිත කාර්යයට නොයෙදවා දින 22 කට පසුව නැවත පියවා තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර මණ්ඩලයේ කර්තව්‍ය හා කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

  1973 අංක 15 දරණ ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩල පනතේ දක්වා ඇති කර්තව්‍ය හා කාර්යයක් යටතට නොගැනෙන වැව්වල පස් ඉවත් කර අධිවේගී මාර්ගවලට විකිණීමේ කටයුතු සිදු කිරීමට භාණ්ඩාගාරයේ හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

  (අ) දේශීය සෝයා බෝංචි වගා කරන ගොවීන් ආරක්ෂා කිරීමේ අරමුණින් 2016-2018 දක්වා ක්‍රියාත්මක කළ සෝයා බෝංචි ව්‍යාපෘතිය මගින් ගොවි සංවිධාන නොවන වෙනත් ආයතනයකින් අනුමත මිලට වැඩියෙන් මිලදී ගැනීම සඳහා රු. 5,238,750 ක අමතර පිරිවැයක් දරා තිබුණි.

(ආ) ත්‍රීපෝෂ සමාගම විසින් නියමිත පිරිවිතරයන්ට අනුකූල නොවීම හේතුවෙන් රු. 3,821,400 ක් වූ සෝයා බෝංචි කිලෝ ග්‍රෑම් 34,740 ක් ප්‍රතික්ෂේප කර තිබූ අතර එම ප්‍රතික්ෂේප වූ තොගයෙන් කිලෝ ග්‍රෑම් 5,500 ක් මණ්ඩලය විසින් නිෂ්පාදනය කරන මවිපෝෂ සඳහා භාවිතා කර තිබුණු අතර ඉතිරි කිලෝ ග්‍රෑම් 29,240 ක් සත්ත්ව ආහාර සඳහා විකුණා තිබුණි. ත්‍රීපෝෂ සමාගමෙන් ප්‍රතික්ෂේප තොග මවිපෝෂ නිෂ්පාදනයට යෙදවීම, අනුගමනය කළ යුතු නිෂ්පාදන ප්‍රමිතිවලින් බැහැර වීමක් හා සෞඛ්‍ය නීති උල්ලංඝනය කිරීමක් බව නිරීක්ෂණය විය.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති